**කලවාන ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 අහිතකර මතය**

**-----------------**

කලවාන ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම**

**----------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**--------------------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු. 2,294,617 ක් විය යුතු වුවත්, රු. 1,240,867 ක් පමණක් බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | නිවැරදි බිල්කිරීම් වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු. 2,509,708 ක් මුදලින් ලැබී තිබුණද, ලැබිය යුතු උසාවි දඩ ලෙජර් ගිණුම තුල රු. 1,207,458 ක මුදලක් පමණක් ගලපා තිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව. | මුදලින් ලැබීම් වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ, මුද්දර ගාස්තු අධි වෙන්කිරීම් පිළිවෙලින් රු. 1,445,624 ක් හා රු. 5,916,537 ක් වෙනුවෙන් හඳුනාගෙන ගැලපීම් කර නොතිබුණි. | | අධි වෙන්කිරීම් ලෙජර ගිණුම මඟින් ගැලපිය යුතුය. |
| (ඈ) | පොතුපිටිය පාසල අසල ක්‍රීඩාංගනය සංවර්ධනයට අදාල රු. 1,474,438 ක් මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කර නොතිබුණි. | | ක්‍රීඩාංගන සංවර්ධන කිරීමේ වියදම ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාල කලවාන සතිපොල බදු ආදායම රු. 495,360 ක් වුවද, රු. 100,000 ක් පමණක් බිල්කිරීම් ලෙස දක්වා තිබුණි. | | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරන ලද රු. 707,097 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් හා වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (උ) | ස්ථාවර වත්කම් පරිත්‍යාග වටිනාකම රු. 469,200 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය තුල ගලපා නොතිබුණි. | | පරිත්‍යාග වටිනාකම් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය තුල ගැලපිය යුතුය. |

## 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 40,371,254 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් සැසඳිය යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) | වසර දෙකක් ඉක්මවූ ටෙන්ඩර් ඇප වටිනාකම රු. 383,000 ක්, ගිවිසුම් ඇප වටිනාකම රු. 8,943,260 ක් හා විවිධ ඇප තැන්පත් වටිනාකම රු. 12,351,802 ක් වශයෙන් එකතුව රු. 21,678,062 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තවදුරටත් පරීක්ෂා කර බලා ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 1,464,664 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 5,797,765 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට ඒකක 496 ක රු. 2,725,598 ක වරිපනම් බදු හිඟයක් පැවතුණු අතර, ඒ තුල රාජ්‍ය ආයතන 02 කින් අයවිය යුතු රු. 33,299 ක ශේෂයක් හා පෞද්ගලික ඒකක 494 කින් අයවිය යුතු රු. 2,692,299 ක ශේෂයක් පැවතුණි. | පවතින ආර්ථික තත්ත්වය හමුවේ බදු අයකිරීමේ කටයුතු ඉතා අපහසු බවත් ජංගම වැඩසටහන් පවත්වා හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | පනතේ වගන්ති හා යොමුගත රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු සමීක්ෂණයක් මඟින් හඳුනාගෙන ඇති දැනට ප්‍රදර්ශනය කර ඇති, ස්ථිර දැන්වීම් පුවරු 24 කින් 2020 වර්ෂය සඳහා රු. 270,425 ක්ද, 2021 වර්ෂය සඳහා පුවරු 27 කින් රු. 323,675 ක් ද ලෙස එකතුව රු. 594,100 ක මුදලක් විගණිත දිනය වූ 2022 ජනවාරි 19 දින වනවිටත් සභා අරමුදලට අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි. | ලිපි මඟින් දැනුවත් කර ජංගම වැඩසටහන් පවත්වා අදාල ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | බල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති දැන්වීම් පුවරු හඳුනාගෙන අයවිය යුතු මුදල් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීම සඳහා 2015 සිට 2019 වර්ෂය දක්වා කටයුතු කර නොතිබූ අතර, 2020 | එම අනවසර ඉදිකිරීම් නතර කරන ලෙසත්, නියමානුකූල කිරීමට සභාව වෙත අයදුම්පත් යොමුකරන ලෙසත් දන්වා යවා | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ නියමානුකූල කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සිට 2021 ජූනි දක්වා හඳුනාගත් අනවසර ඉදිකිරීම් 05 ක් සම්බන්ධයෙන් කාර්මික නිලධාරී වාර්තා ලබා ගැනීමට යොමුකර, එක් අනවසර ඉදිකිරීමක් නියමානුකූල කිරීමටත්, ඉතිරි අනවසර ඉදිකිරීම් ඉවත් කරන ලෙස දන්වා ලිපි යැවීම පමණක් සිදුකර තිබුණි. ඒ අනුව සභා බල ප්‍රදේශයේ ඇති අනවසර ඉදිකිරීම් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය. | ඇති බව. | |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයිති රජ්ජුරුවත්ත - මල්වලාකැලේ ප්‍රදේශයේ ඇති අ.ග.සි. 243 හි ලොට් 200 දෙබරබැඳි හේනේ මූකලාන ඉඩමෙහි වූ සභාවට අයත් නිවාස 02 ක් පුද්ගලයින් දෙදෙනෙකුට 1983 වර්ෂයේදී ගිවිසුම්ගත නොවී මාසිකව රු. 40 කට බදු දී ඇති අතර, එක් පදිංචිකරුවෙකු 2021 දෙසැම්බර් 02 දිනැති ලිපිය මඟින් දන්වා තිබුණේ ඔහු 2000 වසර දක්වා බදු ගෙවා ඇති බවත්, ඒ අනුව එම නිවාසවල අයිතිය පවරා දෙන ලෙසයි. ඒ අනුව සභාවට අයත් නිවාස 02 න් 2000 වසරෙන් පසුව තක්සේරු කර බදු මුදල් අයකර ගැනීමට සභාව අපොහොසත් වී ඇති බවත්, මෙම ඉඩම් මැනුම් කර නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය. | තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව ලැබී ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | ඉඩම මැනුම් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පොතුපිටිය පාසල අසල ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා රු. 1,500,000 ක ඇස්තමේන්තුවකට අනුමත කර පාසලේ අවසරයකින් තොරව 2021 මාර්තු 02 දින ඉහත ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාව මඟින් සෘජු ශ්‍රම පදනමින් ක්‍රියාත්මක කර තිබූ අතර, ගිවිසුම් කාලය දින 08 ක් වුවත්, ව්‍යාපෘතිය ආරම්භ කර වසරකට අධික කාලයක් ගතව තිබුණද, ව්‍යාපෘතියේ වැඩ අතරමඟ නතර වීමෙන් ක්‍රීඩාපිටිය ක්‍රීඩා කළ නොහැකි තත්ත්වයට පත්වීමෙන් එම පාසැල් ළමුන් මෙන්ම ප්‍රදේශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අපහසුතාවයට පත්ව තිබුණි. ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ අනුව යන්ත්‍ර සූත්‍ර සඳහා වැය වන ඉන්ධන වියදම් පමණක් ප්‍රතිපූර්ණය කළ යුතු වුවද, පළාත් සභා ගොඩනැගිලි ඉදිකිරීම් අනුමත මිල ගණන් අනුව රු. 1,474,438 ක ගෙවීම් වාර්තා හා මිනුම් වාර්තා ප්‍රාදේශීය සභාව මඟින් ඉදිරිපත් කර තිබුණි. | අදාල නිලධාරීන් විසින් මෙතෙක් පිළිතුරු ලබාදී නොමැති බව. | නියමිත කාලය තුළ කාර්යය ඉටුකර ගැනීමටත්, එමඟින් අපේක්ෂිත ප්‍රතිඵලය ලහාකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශය තුළ සමාලෝචිත වර්ෂයේදී සන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 70 ක් පමණ බැහැර කිරීම සඳහා කාර්යය මණ්ඩල සේවකයින් 14 දෙනෙකු වෙනුවෙන් රු. 3,176,698 ක්ද, වාහන 03 ක් වෙනුවෙන් රු. 1,192,695 ක්ද දරා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත්ව හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දැමීම මඟින් පාරිසරික ගැටළු රාශියක් මතුවී තිබුණි. | කසළ අංගනයක් ඉදිකිරීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන සභාව සතුව නොමැති බවත්, අදාල ඉල්ලීම් පළාත් සභාව වෙත යොමුකර ඇති බව. | සන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කර විධිමත්ව සන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදුකළ යුතුය. |